ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය ඉන්දියාවේ 79 වන නිදහස් දිනය සමරයි</u>**

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා 79 වන ඉන්දිය නිදහස් දිනය සමරමින් ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය විසින් සංවිධානය කරන ලද වාර්ෂික රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා සහභාගී විය. 2025 සැප්තැම්බර් 15 වන දින පැවති මෙම අවස්ථාව සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ද සහභාගී විය. ප්‍රමුඛ පෙළේ ඉන්දිය සහ ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්, මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන්, ආයෝජකයන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ශ්‍රී ලංකා - ඉන්දියා සමාජයේ සභාපතිනි යමුනා ගනේෂලිංගම් මහත්මිය සහ සාමාජිකයන් ඇතුළු අමුත්තන් රැසක් මේ සඳහා සහභාගී වූහ.

2. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා 2024 දෙසැම්බර් මස සිදු කළ ඉන්දිය සංචාරය සහ ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2025 අප්‍රේල් මස සිදු කළ ශ්‍රී ලංකා සංචාරය සිහිපත් කරමින් ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා අන් කවරදාටත් වඩා ඉහළ තැනක පවතින බව ප්‍රකාශ කළේය. මෙම සංචාරයන් සමඟ අවබෝධතා ගිවිසුම් 7ක් අත්සන් තැබුණු අතර ඒ හරහා නව ව්‍යාපෘතීන් සහ සම්බන්ධකතාවය, බලශක්තිය, ආරක්ෂාව, ඩිජිටල් පරිවර්තනය, ධාරිතා ගොඩනැගීම සහ කලාපීය සංවර්ධනය ඇතුළු ප්‍රධාන ක්ෂේත්‍රයන්හි ප්‍රගතියට දොරටු විවර විය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ස්වභාවික සහකරුවන් සහ ශිෂ්ටාචාරමය නිවුන් සහෝදරයන් බව අවධාරණය කළ එතුමා අවැසි මොහොතේදී ශ්‍රී ලංකාවට කඩිනමින් උපකාර කිරීම ඉන්දියාවේ ‘අසල්වැසියා ප්‍රථමයතේ’ සහ ‘MAHASAGAR” යන දැක්ම පිළිබිඹු කරන බව පැවසීය.

3. ඉන්දියාව වේගයෙන්ම සංවර්ධනය වන ප්‍රධාන ආර්ථිකය බවත් වර්ෂ 2038 වන විට ලොව දෙවන විශාලතම (PPP) ආර්ථිකය බවට පත්වන

බව පුරෝකථනය කර තිබෙන බවත් සඳහන් කළ මහ කොමසාරිස්තුමා අපනයන වෙළෙඳපොළක්, සැපයුම් දාම සහකරුවෙක් සහ ආයෝජන මූලාශ්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවට එයින් ප්‍රතිලාභ ලබා ගත හැකි බව සඳහන් කළේය. ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දී තිබෙන සංවර්ධන සහයෝගය ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 7ක් බවත් එයින් ඇමරිකානු ඩොලර් මිලියන 800කට අධික ප්‍රමාණයක් ආපසු නොගෙවිය යුතු ප්‍රදාන බවත් එතුමා ප්‍රකාශ කළේය. ඉන්දියාවේ සංවර්ධන සහයෝගය යටතේ නිවාස, සෞඛ්‍ය, දුම්රිය, අධ්‍යාපනය, ඩිජිටල්කරණය සහ පුනර්ජනනීය බලශක්තිය වැනි ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘතීන් දිවයිනෙහි දිස්ත්‍රික්ක 25ම ආවරණය කරමින් ක්‍රියාත්මක කර තිබෙන බව ද මහ කොමසාරිස්තුමා සඳහන් කළේය.

4. මෙම අවස්ථාව අමතමින් අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ශ්‍රී ලංකාව ඉන්දියාවේ වේගවත් ආර්ථික වර්ධනය පිළිබඳ ආඩම්බරයට පත් වන බව ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකා රජය ඉන්දීය සාගර කලාපය තුළ සාමය සහ ස්ථායිතාවය සහතික කිරීමට කටයුතු කරන අතරම ලොව තවෙන විශාලතම ආර්ථිකය වීමට නියමිත රටක් ආසන්නයේ සිටීමේ වාසිය ලබා ගැනීමට අපේක්ෂා කරන බව එතුමා පැවසීය. ඖෂධ සහ වෛද්‍ය උපකරණ නිෂ්පාදනය ඇතුළු ක්ෂේත්‍රයන්හි ආයෝජනය කරන ලෙස එතුමා ඉන්දීය සමාගම්වලට ආරාධනා කළේය. එසේම, අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතා ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය ස්ථාපනය කළ දින සිට දරෙට අතර සමාජ සහ සංස්කෘතික සබඳතා ප්‍රවර්ධනය කිරීමෙහිලා එහි කාර්යභාරය අගය කළේය.

5. 1949 වසරේදී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය දරෙට අතර පැරණිතම මිත්‍රත්ව සමාජය වන අතර ජනතාව අතර සබඳතා සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීමෙහිලා වැදගත් භූමිකාවක් ඉටු කරයි.

***

**කොළඹ**
***2025*** *සැප්තැම්බර්* ***18***